# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 12,162—1960 ජූලි 22 වැනි සිකුරාදා—22.7.1960**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ... | — | ආණ්ඩුවේ නිවේදන ... ... ... | 775 |
| අග්‍රාණ්ඩුකරාතුමාණන් කරන පත් කිරීම් ... | 773 | මිල පාලන දැන්වීම් ... ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ... | 774 | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | 774 | ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... | — |
| වෙනත් පත් කිරීම් ... ... ... | 775 | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 775 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... | — | "සුරාබදු ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම්

**1960 අංක 298**

අංකය : ඩී. 11/රෙක්ට්.

**යුද්ධ හමුදාව—නිත්‍ය හට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද කොමිෂන් බලපත්‍ර**

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් පහත සඳහන් කරන ලද වොරන්ට් ඔෆිසර් වරුන් 1960 ජූලි මස 15 වැනි දින සිට, යුද්ධ හමුදාවේ නිත්‍ය හට සේනාවේ ලෙෆ්ට්ටිනන්ට් සහ කුවාටර්මාස්ටර් වරුන් වශයෙන් කොමිෂන් බලපත්‍ර ලත් ධුරවලට පත් කිරීම සහ ඔවුන්ගේ නාමවලට කෙළින් සඳහන් කර තිබෙන බලකාය/රෙජිමේන්තුවලට ඇතුළත් කිරීම අනුමත කොට තිබේ:—

එස්/68004 ඊ/ඩබ්ලිව්. ඕ. 1 හියු ඩග්ලස් ඩේවිස්—ලංකා විදුලි සහ යාන්ත්‍රික ඉංජිනේරු අංශය.

එස්/87003 ඊ/ඩබ්ලිව්. ඕ. 1 චාර්ල්ස් නිව්ටන් ද අල්විස්—ලංකා යුද්ධ හමුදා වෙඩි ද්‍රව්‍ය බලකාය.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

එච්. ඊ. තෙන්නකෝන්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1960 ජූලි මස 11 දින,
කොළඹ දීය.

**1960 අංක 299**

අංකය : ඩී. 11/රෙක්ට්.

**යුද්ධ හමුදාව—නිත්‍ය හට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්**

1959 නොවැම්බර් මස 3 වැනි දින සිට, කපිතාන් සහ කුවාටර් මාස්ටර් වශයෙන්—

ලෙෆ්ට්ටිනන්ට් සහ කුවාටර්මාස්ටර් එන්. නඩරාජසිංගම්, සී.ඒ.සී.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

එච්. ඊ. තෙන්නකෝන්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1960 ජූලි මස 11 දින,
කොළඹ දීය.

---

**1960 අංක 300**

අංකය : ඩී. 17/රෙක්ට්.

**යුඩ හමුදුව—නිත්‍ය හට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද මාරුකිරීමක්**

1960 ජූලි මස 4 වැනි දින සිට, ලංකා ඉංජිනේරු කණ්ඩායමට මාරුකිරීමක්—

උප ලෙෆ්ට්ටිනන්ට් ජේ. ආර්. එස්. ද සිල්වා, එස්. ආර්.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

එච්. ඊ. තෙන්නකෝන්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1960 ජූලි මස 12 දින,
කොළඹ දීය.

1960 අංක 301

අංකය : සී 31/රෙක් ඩි.

## යුධ හමුදාව—නිත්‍ය හට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද 1960 ජූනි මස 24 වැනි සිකුරාදා පළකරන ලද අංක 12,149 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ දැක්වෙන නිවේදනය සංශෝධනය කිරීම

"තාවකාලික කපිතාන් වරුන් වශයෙන්" සටහනේ දැක්වෙන "ලෙප්ටිනන්ට් එෆ්. ඩබ්ලිව්. ඒ. ඩයස්, සී.සී.එම්.පී.—1960 පෙබරවාරි මස 9 වැනි දින සිට" යන්න වෙනුවට,

"ලෙප්ටිනන්ට් එෆ්. ඩබ්ලිව්. ඒ. ඩයස්, සී.සී.එම්.පී.—1960 පෙබරවාරි මස 8 වැනි දින සිට" යන්න යොදන්න.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

එච්. ඊ. තෙන්නකෝන්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ සහිර ලේකම්.

1960 ජූලි මස 12 දින,
කොළඹදීය.

---

# රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

1960 අංක 302

රාජ්‍ය සේවා කොමිෂන් සභාව පහත සඳහන් පත් කිරීම් කරන ලෙස නියම කර ඇත්තේය :—

ඒ. 159/57.

1957 නොවැම්බර් මස 15 වැනි දින සිට ඇස්. පී. සිම්ස් මහතා සහකාර පොලිස් සුපිරින්ටැන්ඩන්ට් වරයෙකු වශයෙන්.

ඒ. 71/60.

1960 ජූනි මස 1 වැනි දින සිට ඒ. සී. ඩෙප් මහතා පළමුවෙනි ශ්‍රෙණියේ පොලිස් සුපිරින්ටැන්ඩන්ට් වරයෙකු වශයෙන්.

ඒ. 71/60.

1960වේ ජනවාරි මස 17 වැනි දින සිට ආර්. ඇන්. ඩී. ජීල්ලා මහතා පළමුවෙනි ශ්‍රෙණියේ පොලිස් සුපිරින්ටැන්ඩන්ට් වරයෙකු වශයෙන්.

ඊ. ජී. ගුණවර්ධන,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1960 ජූලි මස 18 වැනි දින,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. 500, කොළඹ 1.

---

# අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

1960 අංක 303

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත්කිරීම් කර ඇත්තේය :—

අංකය : ජේඑස්සී. පීපී.4/60.

අයි. එම්. ඉස්මයිල් මහතා 1960 ජූනි 27 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, මහනුවර රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, මහනුවර අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, හා දුම්බර අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑස්සී. පීපී. 4/60.

ඊ. සී. ටී. ලාබ්‍රොයි මහතා 1960 ජූනි 27 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, අවිස්සාවේල්ලේ මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා අවිස්සාවේල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ. 21/48.

අයි. එම්. ඉස්මයිල් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1960 ජූලි 29 වැනි දින සිට, ගම්පොල මහෙස්ත්‍රාත් උසාවියේ අංක 597, 1,213, 9,579, 640, 1,582 හා 510 නඩු හා නාවලපිටියේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 7,937, 8,685, 6,251, 8,990, 1,075, 8,598 හා 9,523 නඩුද අවසාන වන තුරු ඇසීමට හා තීන්දු දීමට, ගම්පොල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඒ. 34/48.

ඒ. අයි. අබේවික්‍රම මහතා 1960 ජූලි 15 වැනි දින කෑගල්ලේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 27,824 නඩුවේ, කෑගල්ලේ මහෙස්ත්‍රාත්තුමාගේ සාක්ෂිය සටහන් කර ගැනීම පිණිස, කෑගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා කෑගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 67ඒ/58.

ඩබ්ලිව්. සී. තාමෝතරම් මහතා නැවත වැඩ බාරගන්නා තුරු, හෝ නැවත නියමයක් කරන තුරු, එස්. ඉලෙයතම්බි මහතා 1960 ජූලි 9 වැනි දින සිට, යාපනේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා යාපනේ මල්ලාකම් පිහිටි උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 8සී/57.

බී. ඊ. ද සිල්වා මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, සී. ඒ. එල්. කොරෙයා මහතා 1960 ජූලි 12 වැනි හා 13 වැනි දිනයන්හි, හලාවත අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හලාවත අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, පුත්තලමේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා පුත්තලමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 57ඒ/57.

කේ. ඩී. ඕ. එස්. එම්. සෙනෙවිරත්න මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ඒ. බැස්ටියන්ස් මහතා 1960 ජූලි 26 වැනි දින, මාතර, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා මාතර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 61/48.

එන්. සිවඥානසුන්දරම් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, කේ. එස්. රාජේන්ද්‍රම් මහතා 1960 ජූලි 22 වැනි හා 23 වැනි දිනයන්හි, පේදුරුතුඩුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා පේදුරුතුඩුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඒ. 8/48.

ජේ. ජේ. ඩේවිඩ් මහතා 1960 ජූලි 23 වැනි දින සිට, මඩකලපුවේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 6,122 නඩුව ඇසීමට හා තීන්දුව දීමට, මඩකලපුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා මඩකලපුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ. 40/48.

බී. ආර්. ජී. විජයකෝන් මහතා 1960 අගෝස්තු 30 වැනි දින සිට, මාතලේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 5,189 නඩුව අවසාන වන තුරු ඇසීමට හා තීන්දුව දීමට, මහනුවර, මාතලේ පිහිටි උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා මාතලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 49/48.

එස්. එන්. රාජදුරේ මහතා නැවත වැඩ බාරගන්නාතුරු, හෝ නැවත නියමයක් කරන තුරු, එම්. එසුරපාදම් මහතා 1960 අගෝස්තු 1 වැනි දින සිට, පේදුරුතුඩුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා පේදුරුතුඩුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ. 12/48.

ජේ. එන්. සී. තිරුචෙල්වම් මහතා 1960 ජූලි 12 වැනි දින සිට, කොළඹ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 29,566/ඒ නඩුවේ තීන්දුව දීමට, කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 58/48.

පී. ඒ. ද එස්. සේනාරත්න මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එච්. බී. පෙරේරා මහතා 1960 ජූලි 28 වැනි දින, කුරුණෑගල අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 68සී/51.

සී. වී. උදලාගම මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එස්. නටරාජා මහතා 1960 ජූලි 31 වැනි දින සිට 1960 අගෝස්තු 8 වැනි දින දක්වා, අනුරාධපුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, අනුරාධපුරේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මන්නාරමේ හා වවුනියාවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, වවුනියාවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, හා ත්‍රිකුණාමලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑච්. 34/48.

ජේ. එච්. ප්‍රනාන්දු මහතා 1960 ජූලි 13 වැනි දින සිට, කෑගල්ලේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 24,918 නඩුවේ තීන්දුව දීමට, කෑගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, හා කෑගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : පීඑල්./පී. 3/48.

සී. එල්. පෙරේරා මහතා නැති අතර, ජී. ආර්. ද වාස් මහතා 1960 ජූලි 11 වැනි දින, මීගමුව දිස්ත්‍රික්කයේ උතුරු අළුත්කුරු කෝරලේ ඒ සහ බී, දකුණු අළුත්කුරු කෝරලේ හා බස්නාහිර සියනෑ කෝරලේ (අදිකාරි පත්තුවේ) ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පී.එල්/පී. 7/56.

එම්. එම්. පෙරේරා මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එල්. සේනානායක මහතා 1960 ජූලි 11 වැනි හා 12 වැනි දිනයන්හි, කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුවේ ගම්බද උසාවියේ හා වන්නි හත්පත්තුවේ, කටුගම්පොල හත්පත්තුවේ හා හිරියාල හත්පත්තුවේ (නිකවැරටියේ පිහිටි උසාවියේ), අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

එස්. ආර්. විජේයතිලක,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1960 ජූලි 14 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කායඪාලය,
තැ. පෙ. අංකය 573,
කොළඹ 12.

---

## වෙනත් පත් කිරීම්

**1960 අංක 304**

අංකය : ඒ.ජේ. 20/8/55.

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ ගරු අධිකරණ අමාත්‍යවරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව එතුමා විසින්—

මුදලි ඒ. ඒ. අරුණාචලම් මහතා යාපනය අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

ඇම්. විජේයකුලසූරිය මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

ජේ. ඩබ්ලිව්. මහකුමාරගේ මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද පත්කර ඇත්තේ ය.

ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 16 වෙනි පරිච්ඡේදයේ 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින්—

ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 365 (1) වගන්තිය යටතේ අවශ්‍ය වූ විට හදිසි මරණ පිළිබඳ වෛද්‍ය විභාග පැවැත්වීමට නියම කිරීමේ බලයද ඇතිව 1960 ජූනි මස 1 වෙනිදා සිට මඩකලපු දිස්ත්‍රික්කයේ කරවාකු සහ නින්තවූර් පත්තුවල ප්‍රාදේශීය ආදායම් නිලධාරි ධුරය දරණ කාලය තුළ එම පත්තුවල පරීක්ෂක ධුරයට එන්. සිවඥානසුන්දරම් මහතාද,

1960 ජූලි මස 6 වෙනි දින සිට බදුලු දිස්ත්‍රික්කයේ යටිකිඳ කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි ධුරය දරණ කාලය තුළ එම කොට්ඨාශයේ පරීක්ෂක ධුරයට ටී. එම්. විජේරත්න බණ්ඩා මහතාද,

1960 ජූලි මස 6 වෙනි දින සිට බදුලු දිස්ත්‍රික්කයේ බින්තැන්න කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි ධුරය දරණ කාලය තුළ එම කොට්ඨාශයේ පරීක්ෂක ධුරයට කේ. බී. ඒකනායක මහතාද

පත්කර ඇත්තේ ය.

ජී. සී. ටී. ඒ. ද සිල්වා,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩ බලන සථිර ලේකම්.

1960 ජූලි මස 18 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

---

## ආණ්ඩුවේ නිවේදන

අ. ආ. කා. අංකය : O. 330/49.

ඒකාබද්ධ මලයාවේ, යුඅංඩි පර්චුආන් එගොං නව රජෙයාන් තම යාණන් වහන්සේ රාජ්‍ය පද ප්‍රාප්තවූවායින් පසු, ලංකාවෙහි, ඒකාබද්ධ මලයාවේ මහ කොමසාරිස් ලෙස බලය පවරනු ලැබූ, ඩාටෝ සැමුවෙල් වෙල්වසිංගම් මැක්ඉන්ටයර් උතුමාණන් වහන්සේගේ අක්ත පත්‍රය මහා රාජිණිය වෙනුවෙන් අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ භාර ගත්හ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ.
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1960 ජූලි 18 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයේ දී.

---

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**1946 යේ අංක 32 දරණ වාරිමාර්ග ආඥාපනත**

රත්නපුර දිස්ත්‍රික්කයේ රජයේ දිසාපති නැන්පත් ලයනල් බාක්‍රොෆ්ට් අබයරත්න මහතා විසින් 1946 යේ අංක 32 දරණ වාරිමාර්ග ආඥාපනතේ අංක 113 දරණ වගන්තියේ ප්‍රකාර මා වෙත පවරා ඇති බලතල අනුව, රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස්වර බී. සී. ආර්. ජයසිංහ වන මම, එකී වාරිමාර්ග ආඥාපනතේ අංක 15 (1) (ඒ) දරණ වගන්තියේ ප්‍රකාර පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් යෝජනාව අනුමත කරමි.

බී. සී. ආර්. ජයසිංහ,
ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන.
රත්නපුර දිස්ත්‍රික්කය.

ගොවිජන සේවා කායඪාලය,
බටුගෙදර, රත්නපුර,
1960. 7. 14.

### උපලේඛනය

"1946යේ අංක 32 දරණ වාරිමාර්ග පනතේ V වන කොටස අනුව සකස් කරනු ලැබූ රත්නපුර දිස්ත්‍රික්කයේ, නවදුන් කෝරළේ දෙනවක පාතකඩ පිහිටි උණපඳුරගාවා අමුණ නමැති සුළු වාරි කර්මාන්තය නැතිම එම සුළු වාරිකර්මාන්තයෙන් ප්‍රයෝජනය ලැබිය හැකි කුඹුරුහිමියන් වන අපගේ මෙම රැස්වීමේදී එකී සුළු වාරි කර්මාන්තය නැතිම අනුමත කරන අතරම එකී කර්මාන්තයෙන් වැඩ කළ හැකි හැම කුඹුරක්ම රත්නපුර දිස්ත්‍රික්කයේ රජයේ දිසාපති තුමන්ගේ සතුටට හේතුවන අයුරු වැඩ කිරීමට ද එකඟ වෙමු".

---

### පිස්සු බල්ලෝ

බදුලු දිස්ත්‍රික්කයේ දැනට බල්ලන්ගෙන් අන්තරා තිබෙන බැවින් පිස්සු බල්ලන් සම්බන්ධව ආඥාපනතේ අංක 333 දරණ පරිච්ඡේදයේ අංක 11 දරන වගන්තිය යටතේ 1960 ජූලි මස 13 වෙනි දින සිට මාස හයකට එම පලාත බදුල්ල, බණ්ඩාරවෙල සහ හපුතලේ පළාත් ආණ්ඩු සභා සහ වැලිමඩ සහ පස්සර සුළු නගර සභාවලට අයත් ප්‍රදේශ හැර පිස්සු බලු රෝගයට යටත් ප්‍රදේශයක් හැටියට ප්‍රකාශ කරන බව මෙයින් දැනුම් දෙමි.

2. එබැවින් බදුලු දිස්ත්‍රික්කයේ ඉහත ප්‍රකාශයට යටත් ප්‍රදේශ තුළ නොබඳින ලද හෝ අල්ලා 'නොගෙන යන බල්ලෙක් අන් කෙනෙකුගේ ගෙදරක හෝ වත්තක හැර ප්‍රසිඬ ස්ථානයක, පාරක හෝ වෙනයම් ස්ථානයක සිටියොත් ඌ වහාම මරා දමන්නට පුළුවන් බව මෙයින් දන්වනු ලැබේ.

බී. පී. වී. ඒ. ජේ. පී. සේනාරත්න,
බදුලු දිස්ත්‍රික්කයේ දිසාපති.

වර්ෂ 1960 ජූලි මස 13 වැනි දින,
බදුලු කච්චේරිය.

### ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

**දුම්රිය මාර්ගය හරහා මහාමාර්ගය වැටී ඇති ස්ථාන අළුත්වැඩියා කිරීම**

මඩකලපුව-ත්‍රිකුණාමලය දුම්රිය මාර්ගයේ තම්පලකාමම් සහ චීනවාඩිය දුම්රියපලවල් අතර හැ. 170, ද. 26 දරණ මහනුවරට යන මහා මාර්ගයේ හැ. 100 1/4 කනුව අසල දුම්රිය මාර්ගය හරහා වැටී ඇති ස්ථානය අළුත්වැඩියා කිරීම සඳහා වර්ෂ 1960 ජූලි මස 23 වෙනි සෙනසුරාද සවස 6 සිට පසුදින ඉරිදා උදය 6 දක්වා රථවාහන ගමනාගමනයට වසා තබනු ලැබේ. ඉහතකී කාලය තුළදී මෙම ස්ථානයෙන් ප්‍රවේසමෙන් රථවාහන ගමනාගමනය කළහැකිය.

---

### ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

**දුම්රිය මාර්ගය හරහා මහාමාර්ගය වැටී ඇති ස්ථාන අළුත්වැඩියා කිරීම**

කැලණිවැලි දුම්රිය මාර්ගයේ කොටාරෝඩ් සහ නාරාහේන්පිට දුම්රිය ස්ථානයන් අතර හැ. 3. ද. 9 දරණ මැනින් වවුමේ මංගල පාර දුම්රිය මාර්ගය හරහා වැටී ඇති ස්ථානය අළුත්වැඩියා කිරීම සඳහා වර්ෂ 1960 ජූලි මස 23 වෙනි සෙනසුරාද සවස 5 සිට පසුදින ඉරිදා උදය 6 දක්වා රථවාහන ගමනාගමනයට වසා තබනු ලැබේ. ඉහත කී කාලය තුළදී රථවාහන ගමනාගමනය මෙම ස්ථානයෙන් ප්‍රවේසමෙන් යැමට කටයුතු සලස්වනු ලැබේ.

---

### ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

**දුම්රිය මාර්ගය හරහා මහාමාර්ගය වැටී ඇති ස්ථාන අළුත්වැඩියා කිරීම**

පුත්තලම් දුම්රිය මාර්ගයේ බංගදෙනිය සහ බත්තුළුඔය දුම්රිය ස්ථානයන් අතර හැ. 56, ද. 56 දරණ කොළඹ-පුත්තලම් මහා මාර්ගයේ හැ. 54, ද. 65 දරණ ස්ථානය දුම්රිය මාර්ගය හරහා වැටී ඇති ස්ථානයේ තිබෙන පරණ හරස් පාර අළුත්වැඩියා කිරීම සඳහා වර්ෂ 1960 අගෝස්තු මස 6 වෙනි සෙනසුරාදා සවස 6 සිට පසුදින ඉරිදා සවස 6 දක්වා ගමනාගමනයට වසා තබනු ලැබේ. මෙම කාලය තුළදී සියළු රථවාහනාදිය ඒ අසලින් සාදා තිබෙන තාවකාලික හරස් පාරෙන් ගමන් කළ යුතුයි.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයයේ මුද්‍රණය කරන ලදී.